සිළුමිණ සමඟ රසඳුන හා ක්‍රීඩා අතිරේක

සිළුමිණ

சிழுமின The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 92 වැනි කාණ්ඩය 05 වැනි පත්‍රය ★

■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ මකර රවි 17 භාග දුරුතු අව තියවක ඉරිදා ■ වර්ෂ 2021ක් වූ ජනවාරි මස 31 වැනි ඉරිදා මිල රු 80.00

ආණ්ඩුවේ රැකියා ලබාගන්න සිළුමිණ සමඟ ගැසට් එක කියවන්න

↘03

ඇමැති පවිත්‍රාත් IDH රෝහලේ

↘06

ජාතික ආරක්ෂාව ගැන සහතිකයක්



↘08

නිදහස් දිනයට දැන් වසර 73යි

↘13

බදියුදීන් විල්පත්තුව වවයිද?

↘17

කොබෙයිගනේ අවුරුදු කුමරියගේ ඝාතනය

↘25

පෙබරවාරි මස ලග්න පලාඵල

අනුහස් දෙව් බඹුන් සේ මවු බිම රකින
සුවහස් දනන් ඇත රණවිරු නම දරන
සියවස් කලක් දිවි ගමනට සෙත් පතන
නිදහස් මල් පිපී සුවඳයි මුළු දෙරණ

කවි පබැඳුම - රඹුකන සිද්ධාර්ථ හිමි
සිතුවම - හර්ෂ ගුණවර්ධන

කොවිඩ් එන්නත ලබාදීම දෙසතියක් තුළ ලබා දීමට

(තාරක වික්‍රමසේකර)

කොවිඩ් එන්නත් ලබාදීම පසුගිය 29 වැනි සිකුරාදා ඇරැඹුණු අතර මේ වන විට එන්නත් සෞඛ්‍ය හා ආරක්ෂක අංශවල කාර්ය මණ්ඩලයට ලබා දෙමින් පවතී. එසේම දෙවන අදියර යටතේ ප්‍රමුඛතා මත එන්නත් ලබා දීම සිදුවනු ඇත. මේ යටතේ වයස අවුරුදු 60ට වැඩි සහ අතුරු රෝගාබාධ හිමි රෝගීන්ට ප්‍රමුඛතාව හිමි වනු ඇත.

» 2 වැනි පිටුවට

බස්නාහිර පාසල් පෙබරවාරි 15 විවෘතයි!

(සුභාෂිණී ජයරත්න)

බස්නාහිර පළාතේ පාසල් පෙබරවාරි 15 දිනට පෙර සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුව පියවරෙන් පියවර විවෘත කිරීමට රජය තීරණය කර තිබේ. මේ වන විට බස්නාහිර පළාතේ ප්‍රදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සෞඛ්‍ය බලධාරීන්, විදුහල්පතිවරුන් හා අධ්‍යාපන අධ්‍යක්ෂකවරු එක්වී පසුගිය බුහස්පතින්දා, සිකුරාදා හා ඉදිරි සඳුදා රැස්ව එසේ විවෘත කිරීම පිළිබඳව රැස්වීම් පවත්වනු ඇත.

බස්නාහිර පළාතේ පාසල් 1,356ක් ඇති අතර සිසුහු 932,000ක් අධ්‍යාපනය ලබති. මේ වන විට බස්නාහිර පළාතේ පාසල් 907ක් සාමාන්‍ය පෙළ සිසුන් සඳහා විවෘතව ඇති අතර, ලබන 15වැනිදා සිට එම පාසල් සියල්ලම යළි විවෘත නොවුණත් අඩුම වශයෙන් බස්නාහිර පළාතේ ලක්ෂ 3ක සිසු පිරිසක් හෝ පාසල්වලට ගෙන්වා ගැනීම අපේක්ෂිත බව අධ්‍යාපන ලේකම් කපිල සී. පෙරේරා සිළුමිණට පැවසීය.

කෙසේ වෙතත් සමස්ත පාසල් නියෝජනය වන පරිදි පාසල් සිසුන්ට රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂාව සිදු කරන ලෙස ගුරු සංගම්ද අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් රැසක් කර ඇති අතර ගුරු සංගම් පවසා සිටින්නේ පසුගිය දෙසතිය තුළ පාසල් සිසුන් 70ක් පමණ කොවිඩ් වසංගතයට ගොදුරු වී ඇති බවයි.

ශ්‍රී ලංකාවට කොවිඩ් එන්නත එයි

ඉන්දීය රජය විසින් ප්‍රදානය කළ ඔක්ස්ෆර්ඩ් ඇස්ට්‍රාසෙනිකා කොවිඩ් මරදන එන්නත්කරන වැඩසටහන ජනවාරි 29 වැනිදා IDH බෝවන රෝග විද්‍යායතනයේදී නිල වශයෙන් ආරම්භ විය. එහිදී පළමු එන්නත එම රෝහලේ විශේෂඥ වෛද්‍ය ආනන්ද විජේවික්‍රම විසින් ලබා ගත් අයුරු මෙහි දැක්වේ. මේ අවස්ථාවට සහභාගි වූ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ, ප්‍රාථමික සෞඛ්‍ය සේවා වසංගත හා කොවිඩ් වැළැක්වීමේ රාජ්‍ය ඇමැතිනි විශේෂඥ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක ලලිත් වීරතුංග යන අයද වෙති.

සේයාරුව - නිරෝෂ බටේපොළ

පොලිස් උසස්වීම් මාර්තු මාසයේ

(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)

පොලිස් නිලධාරීන්ගේ උසස් වීම් කඩිනමින් ලබාදීම පිණිස සොයා බලා කටයුතු කිරීමට විශේෂ මණ්ඩලයක් ද පත්කර ඇති බව මහජන ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් විශ්‍රාමික මේජර් ජනරාල් ජගත් අල්විස් පවසයි.

ඒ අනුව කොස්තාපල් තනතුරෙන් ඉහළ සිට සහකාර පොලිස් අධිකාරි තනතුර දක්වා වන සියලු උසස්වීම් මාර්තු මාසය වනවිට ලබා දීමට හැකි වන බව ලේකම්වරයා පවසයි. ඒ සම්බන්ධ මූලික කටයුතු මේ දිනවල සිදු කරමින් පවතින බව ද ඔහු ප්‍රකාශ කළේ ය.

ලංගම දෛනික ආදායම කෝටි 4කින් බසී

ලංකා ගමනාගමන මණ්ඩලයේ ආදායම දිනකට රුපියල් ලක්ෂ 400කින් පමණ පහළ වැටී තිබෙන බව වාර්තා වේ. දිනක සාමාන්‍ය ආදායම ලක්ෂ 800කට ආසන්න වූ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ආදායම මේ වන විට දිනකට ලක්ෂ 450කට ආසන්න ප්‍රමාණයකට පහළ වැටී තිබේ.

සියලු දුර සේවා බස් රථවල ආසන ගණනට පමණක් මගීන් පුවාහය කරන ලබන හෙයින් ආදායම

සිළුමිණ ව්‍යාපාරික කර්තෘට සම්මානයක්

පාස්කු ප්‍රහාරකයන්ට පිටු 4,000 චෝදනා ගොනු 8ක්